# අඹ පත්‍ර අඹරන ගුල්ලා

එස්.ආනවඩුන් (වි.වි.පැ.සං.)

අඹ පත්‍ර අඹරන ගුල්ලා ලංකාවේ උතුරු පළාතේ අඹ හා ජේණ වගාවන්හිදී දක්නට ලැබෙන පළිබෝධකයෙකි. මේ ගුල්ලාගෙන් වැඩෙන පත්‍රවලට සැලකිය යුතු හානියක් සිදුවේ. මෙම ගුල්ලා කජු, ජම්බු හා කොස් කඹ වලටද මඳ වශයෙන් හානි කරයි.

## ජීවන චක්‍රය

### 1. වැඩුණු සත්ත

වැඩුණු ගුල්ලා මි.මී. 10 පමණ දිගය. මි.මී.5 පමණ පළලය. මෙම ගුල්ලාට ලාක්ෂණික වූ දිග තුණ්ඩාවක් ඇත. ගුල්ලාගේ සිරුර රතු දුඹුරු පැහැතිය. එහි කළු තිරු ශරීරය පුරා ඇත. වැඩුණු සත්ත අඹ පත්‍ර කපා අඹරවා පැහැදිලි මෑ පට ඇඟිලි හැඩැති ව්‍යුහයක් සාදයි. මෑපට ඇඟිලි හැඩැති ව්‍යුහයන් අඹ පත්‍ර ගුල්ලා සාදන්නේ මෙසේය.

පියවර (1) - වැඩුණු ගුල්ලා තුණ්ඩාවේ ආධාරයෙන් පත්‍ර පාදයට ආසන්නයේ අර්ධ වෘත්තාකාර හැඩැති මැද නාරටිය පසුකර පත්‍ර තලය අර්ධ ලෙස කපයි.

පියවර (2) - ඉන් පසු වැඩුණු ගුල්ලා පත්‍රයේ අග දක්වා ගමන් කරන අතර කුඩා සිදුරු පාර්ශවික නාරටි මත බිඳියි .

පියවර (3) - ගුල්ලා පත්‍ර අගට පැමිණි පසු පත්‍ර අගයේ සිට අඟලක් ඈතින් මැද නාරටිය මත තනි අපිරිසිදු කහ වර්ණැති බිත්තරයක් දමයි.

## මර්ධනය

- අතින් ඇල්ලිය හැකි වැඩෙන පැලවල මෑ පට ඇඟිලි හැඩැති ව්‍යුහයක් ඉවත් කර විනාශ කර දමන්න. සමතලයින් අල්ලන දැලක ආධාරයෙන් බිත්තර දමන ගුල්ලන් අල්ලා විනාශ කරන්න.

රූප සටහන් 1 :- අඹ පත්‍ර අඹරන ගුල්ලාගේ හානිය ඇතිවන විවිධ අවස්ථා




රූප සටහන් 2 :- අඹ පත්‍ර අඹරන ගුල්ලාගේ ජීවන චක්‍රය.

